# MIDNIGHT BOULEVARD
## වෘත්තාන්ත චිත්‍රපටය සමග සිනමාවට පිවිසෙන තරුණ සංගීතඥයා
# දිනිත විතානගේ



දිනිත විතානගේ

සිනමාව හා සංගීතය ඔස්සේ තම සංස්කෘතික පරිකල්පනය දියත් කරන දියුණු තරුණයෙක් පසුගිය කාලයේ ටොරොන්ටෝව ආශ්‍රිතව අපේ ඇස ගැසුණා. ඔහු දිනිත විතානගේ. ප්‍රමුඛ ව්‍යවසායකයෙක් හා ප්‍රජා ක්‍රියාකාරිකයෙක් වන වික්ටර් ගමගේ දිනිතගේ මාමා..දිනිත මෙරට තවමත් සිය අධ්‍යාපන ක්‍රියාවලිය නිම කොට නැතත් සිය නිර්මාණ ජීවිතය උසස් ලෙස ප්‍රදර්ශනය කරමින් සිටිනවා. මේ අපූරු තරුණයා දිරි ගැන්වීමේ අරමුණින් යාත්‍රා ඔහු සමග සංවාදයක නිරත වුණා. මේ ඒ සංවාදයයි.







**සංවාදය ආරම්භ කිරීමට පෙර ඔබම ඔබ අපට හඳුන්වා දෙන්න පුළුවන්ද?**

මම ලංකාවෙන් කැනඩාවට එන්නේ වයස අවුරුදු 14දී. මම මගේ මාමා උපන්දිනයට තෑගි කරපු ගිටාරය කරේ තියාගෙන තමා airport එකෙන් බහින්නේ. ඒ කලාවත් රැගෙන මේ රටට නවකයෙක් වගේ ආපු පාරේ තමා තවම ඇවිදින්නේ. මම ගිටාර් වාදනය ඉගෙන ගත්තේ මගේ පාසලෙන්. ඒ බෙලින්ජර් මහත්මිය යටතේ. අවසන් අවුරුදු දෙකේ senior jazz band එකේ lead guitar වාදනය කරන්න මට ආරාධනයක් එනවා. ඉන් පසුව මට Canadian Royal Navy Jazz Band එකත් එක්ක play කරන්න අවස්ථාවක් ලැබෙනවා. අපේ පාසලේ සංගීත ගුරුවරුන්ගේ විරුද්ධත්වය නොතකා මම විශ්වවිද්‍යාලයේ science program එකකට ඉල්ලුම් කරනවා. ඒත් එක්කම මම මගේ සංගීත කටයුතුත් කරගෙන යන්න මම මටම පොරොන්දු වෙනවා. මෙහෙම තමා මම කැනඩාවෙ හොඳම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය හදාරන්න පටන් ගන්නේ. University of Toronto Scarborough සරසවියේ ජීව විද්‍යාව සහ සංගීතය සහ සංස්කෘතිය යටතේ double major එකක් කරන්න පටන් ගත්තා. සරසවියේ අවසාන අවුරුදු කිහිපයේදී තමා මම සිනමාවට ආදරය කරන්න පටන් ගන්නේ. මුලින්ම සිනමා ලෝලියෙක්, දෙවනුව සිනමා සංගීත අධ්‍යක්ෂවරයෙක් සහ තෙවනුව සිනමා අධ්‍යක්ෂ බවට පත්වෙන්නේ ඉතාම කෙටි කාලෙකදී. මගේ පළමු කෙටි චිත්‍රපටයට University of Toronto Film Festival එකේ හොඳම කැමරාකරණයට හිමි සම්මානය ලැබෙනවා. ඒ වගේම, ඒ චිත්‍රපටයේ මා විසින්ම නිර්මාණය කරන ලද සංගීතය, Abram Krashinsky Prize in Music ත්‍යාගය දිනා ගන්නවා. මෙම කුළුඳුල් චිත්‍රපටයෙන් පස්සේ, 2021, මම Italian Spaghetti Western ආභාෂයෙන් තවත් චිත්‍රපටයක් කරනවා. මෙම චිත්‍රපටය විසි වන University of Toronto Film Festival එකේ Best Director & Best Drama සම්මාන දෙකම හිමි කරගන්නවා. එය Canada Shorts Film Festival එකටත් තෝරා ගන්නවා. මෙම චිත්‍රපටය තමා මගේ ඊලග කඩඉම සකස්කරන්නේ. මෙම චිත්‍රපටය සහ මාගේ සංගීත කටයුතු මූලික කරගෙන, මාව ටොරොන්ටෝ සරසවියේ Masters of Music in Music Technology & Digital Media program එකට තෝරා ගන්නවා. මගේ ප්‍රථම චිත්‍රපට වලින් පස්සේ, මම තවත් අධ්‍යක්ෂකවරුන්ගේ කෙටි චිත්‍රපට, documentary සහ feature films ගනනාවකට සංගීතය මෙහෙයවලා තියෙනවා. ඒ චිත්‍රපට ඇමෙරිකාවේ Austµn Film Festival සහ ටොරොන්ටෝවේ Blood in the Snow Film Festival එකෙදී සම්මානයට පාත්‍ර වෙනවා. මම ලෝකේ ප්‍රසිද්ධතම පාවහන් brand එකක් වන New Balance වෙළඳ දැන්වීමකට music director වශයෙන් සහභාගි වෙනවා. ඒත් එක්කම, මම මගේ කළා ජීවිතේ ලොකුම පියවර ගන්නවා. ඒ 2023 නිර්මාණය කළ ”Midnight Boulevard” චිත්‍රපටයෙන්. මෙතෙක් කරපු නැති දේවල් ගොඩක්, කලාකරුවෝ විසි පහකට අධික පිරිසක් සමග, ඩොලර් පන්දාහක් වැනි ඉතාමත් සුළු මුදලකට කරපු මගේ ප්‍රථම වෘත්තාන්ත චිත්‍රපටය එයයි. එය 2024 ජුනි මාසේ, ලංකාවේ PVR සිනමා ශාලාවේ සහ, Toronto වල Innis Town Hall ශාලාව පිරී ඉතිර ගිය ප්‍රේක්ෂක පිරිසකට පෙන්නන්න අවස්ථාව ලැබුනා. මෙම චිත්‍රපටය 2025 නැවතත් වතාවක් ටොරොන්ටෝවේ පෙන්නන්න මම බලාපොරොත්තුවෙන් ඉන්නවා... මම 2025 අප්‍රේල් මස, මගේ masters උපාධිය අරගෙන, සිනමා සංගීතය, music production" composition සහ චිත්‍රපට අධ්‍යක්ෂණය වැඩි දියුණු කරන්න තමා බලාපොරාත්තුව. කවදා හරි අපේ රටේ නාමය Hollywood වල ඉහළම ස්ථානයකට ගෙනියන එක තමා මගේ හීනය. ඒ හීනය සැබෑවක් බවට පත් කරන්න, මම ටිකෙන් ටික මගේ දැනුම වැඩිදියුණු කරගන්නවා.

**ඔබේ චිත්‍රපට දෙකම ඔබේ සිනමා චින්තනය (cinematic thinking) කුමක්ද කියා අනුමාන කරන්න පුලුවන්. එහෙත් එය ඔබම විස්තර කරන්න.**

මගේ සිනමා චින්තනය ”pure cinema'˜ යන අදහසින් පැන නගී. චිත්‍රපටයක් මුලින්ම දෘශ්‍යමය ප්‍රබලත්වයකින් යුතු විය යුතු බව මම විශ්වාස කරනවා. චිත්‍රපටයක භාවිතා කරන වෙනත් ශබ්ද ප්‍රයෝග තරම්ම සංවාදය වැදගත් විය යුතු බව ප්‍රකාශ කරමින් ඇල්ෆ්‍රඩ් හිච්කොක් මෙම ශෛලිය පිළිබඳ ඔහුගේ දර්ශනය ප්‍රකාශ කළේය. සංවාදය වැදගත් නොවන බව ඔහු අදහස් කරන බව මම නොසිතමි. එය එසේ නොවේ. චිත්‍රපටයේ ශබ්දය දෘශ්‍ය රූපවලට ග්‍රහණය කර ගත නොහැකි බොහෝ උපපෙළයන් (subtexts) සම්පූර්ණ කරයි. චිත්‍රපට ඉතිහාසයේ වඩාත්ම අමතක නොවන අවස්ථා කිහිපයක් දක්ෂ ලේඛකයින් විසින් ලියන ලද විශිෂ්ට සංවාදයන්ට ඇතුළත් වේ. කෙසේ වෙතත්, බොහෝ චිත්‍රපට නිෂ්පාදකයින් තම කතා අර්ථවත් කිරීමට දෙබස් මත ඕනෑවට වඩා විශ්වාසය තබා ඇති බව මම විශ්වාස කරමි. ප්‍රේක්ෂකයෙකුට